මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்தியமாகாணசபையின் அரசசேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොටපාර, මහනුවර
இல. 244,கடுகஸ்தொட்டைவீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

කාර්යාලය / காரியாலயம் / Office 081-2213097
ලේකම් / செயலாளர் / Secretary 081-2213096
සහකාරලේකම් / உதவிசெயலாளர் / Asst. Secretary 081-5631321
ෆැක්ස් / பெக்ஸ் / Fax 081-2213082

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/40/18/2022
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2024-12- 30

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සභා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරින්/ සංවර්ධන නිලධාරීන්/ කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු - 2025**

2025 වසරේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ, **කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරි, සංවර්ධන නිලධාරි සහ කාර්යාල සේවක සේවයේ නිලධාරි** යන සේවාවන්ට අදාළ වාර්ෂික ස්ථාන මාරු වීම් සම්බන්ධව අවසන් ස්ථාන මාරු නියෝග අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති අතර, අදාළ ලේඛන එමඟින් භාගත කරගන්නා ලෙස මෙයින් දන්වමි.

02. ඒ අනුව, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත නිකුත් කළ මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GCP/02/වාර්ෂික ස්ථාන මාරු 2025 හා 2024.11.01 දිනැති ලිපියේ සඳහන් නියෝගය පරිදි සහ ගරු කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව, **මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියේ නිලධාරීන්ගේ, මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරීන්ගේ හා මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග 2025.01.16 දිනට නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි ක්‍රියාත්මක කළ යුතු බව කාරුණිකව දන්වමි.**

03. තවද පහත කරුණු කෙරෙහි **ඔබගේ විශේෂ අවධානය** යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ, සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන්ගේ සහ කාර්යාල සේවක සේවයේ නිලධාරින්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී, ප්‍රමාණවත් අනුප්‍රාප්තිකයන් ලබාදී නොමැති නම්, ඉදිරි නව බඳවා ගැනීමකදී හෝ අන්තර් පළාත් ස්ථාන මාරුවීම් මඟින් පැමිණීමට නියමිත නිලධාරීන් හෝ අනුප්‍රාප්තිකයන් ලෙස ලබාදීමට නියමිත බවත්, ඒ අනුව ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් මුදාහැරීමට කටයුතු කරන ලෙසත්,

II. සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු නියෝග දීර්ඝ කර ඇති නිලධාරීන් සඳහා සුදුසු නිලධාරීන් කඩිනමින් පුහුණු කර නියමිත දිනයේදී මුදාහැරීමට කටයුතු කරන ලෙසත්,

III. මේ සමඟ ප්‍රකාශයට පත්කර ඇත්තේ, 2025 වාර්ෂික ස්ථාන මාරු අවසන් නියෝග (අභියාචනයන්ද සලකා බැලීමෙන් පසු) වන බැවින්, මේ සම්බන්ධයෙන් නැවත නැවතත් මෙම කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට කටයුතු නොකරන ලෙසත්,

IV. 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලේඛනයන් හි නම් සඳහන් නොවන, 2023 සහ 2024වර්ෂයන් හි ස්ථාන මාරු නියෝග ලබා මේ දක්වා මුදාහැර නොමැති නිලධාරීන් සිටින්නේ නම්, එම නිලධාරීන්ද වහාම නව සේවා ස්ථාන වෙත මුදාහරින ලෙසත්, එම වර්ෂයන්හි ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් නැවත නැවතත් මෙම කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට කටයුතු නොකරන ලෙසත් දැනුම් දෙමි.

කරු.අ.පිට බලන්න

04. මෙම වාර්ෂික ස්ථාන මාරු සඳහා මාර්ගගත ක්‍රමයට (Online) තොරතුරු කැඳවීමේදී සම්බන්ධීකරණය සඳහා ඔබ විසින් පත් කරන ලද විෂය භාර නිලධරයා විසින්, 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ඔබ ආයතන වෙත සේවයට වාර්තා කර ඇති නිලධාරීන්ගේ තොරතුරු පහත සඳහන් උපදෙස් අනුගමනය කර සම්පූර්ණ කළ යුතුවේ. ඒ බව අදාළ විෂය භාර නිලධාරි දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

I. මුලින්ම ඔබගේ ආයතනයේ Gmail නිල විද්‍යුත් තැපැල වෙත පිවිසෙන්න.

II. වාර්ෂික ස්ථාන මාරු සඳහා පමණක් භාවිත අපගේ විද්‍යුත් තැපැල් ලිපිනය trans.psc.cp.gov@gmail.com මගින් ඔබ ආයතනයේ විද්‍යුත් තැපැල වෙත එවූ පහත සඳහන් **Google spreadsheet** වෙත පිවිසෙන්න.

- 2025 වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් කළමනාකරණ සේවා අධි ශ්‍රේණියේ නිලධාරින් (SUP) සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ලේඛනය
- 2025 වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරින් (DO) සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ලේඛනය
- 2025 වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවයේ නිලධාරින් (KKS) සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ලේඛනය

III. එහි තොරතුරු ඇතුළත් කිරීමේදී Unicode (Iskoola potha) අකුරු වර්ගය පමණක් භාවිත කළ යුතුය.

IV. ඉහත Google spreadsheet හි ඇති සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු හි ඔබගේ ආයතනයට පමණක් අදාළ ස්ථානයක් වෙන් කර ඇති අතර එහි අවසන් තීරු (column) 2 හි පමණක් අදාළ තොරතුරු නිවැරදිව ඇතුළත් කරන්න.

05. පූර්ව වර්ෂයන්හිදී වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව, නව සේවා ස්ථාන වෙත සේවයට වාර්තා කරන නිලධාරීන්ගේ තොරතුරු අදාළ ආයතන විසින් මෙම Google spreadsheet හි නිසි පරිදි යාවත්කාලීන නොකිරීම තුළ ඒ සම්බන්ධ තීරණ ගැනීමේදී මෙම කොමිෂන් සභාවට ගැටළුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදුවූ බැවින්, **වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ඔබ ආයතනය වෙත සේවයට වාර්තා කරන නිලධාරීන්ගේ තොරතුරු මෙම Google spreadsheet හි යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වන අතර, වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමේදී මෙම තොරතුරු භාවිතා කරන බැවින්, සියලුම ආයතන ප්‍රධානීන් මෙය ප්‍රමුඛ කාර්යයක් සේ සැලකිය යුතු බව ද කාරුණිකව දන්වමි.**

06. එම විස්තර ඇතුළත් Google spreadsheet හි ඔබ ආයතනයට අදාළ කොටසෙහි වාර්තාව පමණක් මුද්‍රණයකර (Print out) ආයතන ප්‍රධානියාගේ අත්සන සහිතව **2025.02.21 ට පෙර තැපැල මගින් මෙම කොමිෂන් සභාව වෙත එවිය යුතුය.**

කොමිෂන් සභාවේ නියමය පරිදි,

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත.

පිටපත :
1. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත - දැ.ගැ.ස සහ අ.ක.ස
2. විගණකාධිපති - අ.ක.ස.